# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1900/5 - 2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා - 2015.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

දැන්වීමයි

උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් සහ සැලසුම්, නීතිය හා විනය, ඉඩම්, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරයේ මහ නගර සභා ආඥාපනතේ 289 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහ නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභා සභිකයින් සඳහා වන දීමනා සම්බන්ධව පහත දක්වා ඇති පරිදි වූ විධිවිධාන මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014 නොවැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1626 හා 2009 වන වසරේ ඔක්තෝබර් මස 30 වන දිනැති ගැසට් පත්‍රයේ සඳහන් 2009.10.30 වන දිනැති නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

සී. වී. විග්නේෂ්වරන්,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය,
ඉඩම්, විදුලිය නිවාස, ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත,
රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර,
පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා,
උතුරු පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
අංක 26, සෝමසුන්දරම් ඇවනියු,
චුන්ඩුක්කුලි,
යාපනය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A - PG 2356 — 55 (2015/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**විධිවිධාන**

1. මෙම විධිවිධාන මහ නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට සහ සභිකයින්ට මාසික දීමනා ගෙවීම සම්බන්ධ විධිවිධාන ලෙස හඳුන්වනු ලැබේ.

2. මහනගර සභා සඳහා තේරීපත් වන මහ නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට සහ සභිකයින්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් ගෙවිය හැකිය.

| | | රු. ශත |
|---|---|---|
| * | මහ නගර සභා නගරාධිපති | 30,000.00 |
| * | නියෝජ්‍ය නගරාධිපති | 25,000.00 |
| * | මහ නගර සභා සභික | 20,000.00 |

(සංග්‍රහ දීමනා ද මෙහි ඇතුළත් බව අවධානයට ගත යුතු ය.)

3. පහත සඳහන් අවස්ථාවන්හීදී, මහ නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් පෑමට නොහැකිය :-

i. දීමනාවට අදාළ මාසයේ පවත්වනු ලැබූ මාසික සභා රැස්වීම් නැතහොත් කාරක සභා රැස්වීම් කිසිවකට සහභාගී නොවීම ;

නැතහොත්

ii. කිසියම් සපරාධී ක්‍රියාවක් සම්බන්ධ චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම ;

නැතහොත්

iii. මහනගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 277 (1ආ) (අ) වගන්තියට අනුකූලව මහනගර සභාවේ නැතහොත් මහනගර සභා නගරාධිපතිවරයාගේ නැතහොත් නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නැතහොත් සභිකයාගේ ක්‍රියාදාමයන් හා කර්තව්‍යයන් අත්හිටුවීම.

3.1. කෙසේ වුවද,

i. රැඳවුම්භාරයේ සිටීම නැතහොත් සිරගත වී සිටීම නැතහොත් නිවාඩුවේ සිටීම නැතහොත් සේවයෙන් අත්හිටුවීම කාලසීමාව, යම්කිසි මාසයක කොටසක්ව තිබෙන විටක, එකී මාසයේ පවත්වනු ලැබූ රැස්වීමකට සහභාගී වීම මත එකී කාලයට අදාළ ප්‍රතිශතය පදනම්න් මෙම දීමනාව ගෙවිය හැකිය.

ii. වෛද්‍ය හේතූන් මත අදාළ සාධක ඉදිරිපත් කර සභාවේ අනුමැතිය සමගින් සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

iii. මහ නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු නැතහොත් සභිකයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

02 - 494/1

## උතුරු පළාතේ පළාත් සභාව

### දැන්වීම

උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් සහ සැලසුම්, නීතිය හා විනය, ඉඩම්, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරයේ නගර සභා ආඥාපනතේ 193 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභා සභාපති, නගර සභා උපසභාපති හා සභා සභිකයින් සඳහා වන දීමනා සම්බන්ධව පහත දක්වා ඇති පරිදි වූ විධිවිධාන මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014 නොවැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1626 හා 2009 වන වසරේ ඔක්තෝබර් මස 30 වන දිනැති *ගැසට් පත්‍රයේ* සඳහන් 2009.10.30 වන දිනැති නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

සී. වී. විග්නේෂ්වරන්,
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය,
ඉඩම්, විදුලිය නිවාස, ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත,
රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර,
පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා,
උතුරු පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
අංක 26, සෝමසුන්දරම් ඇවනියු,
චුන්ඩුක්කුලි,
යාපනය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### විධිවිධාන

1. මෙම විධිවිධාන නගර සභා සභාපතිවරුන්ට, උපසභාපතිවරුන්ට සහ සභිකයින්ට මාසික දීමනා ගෙවීම සම්බන්ධ විධිවිධාන ලෙස හඳුන්වනු ලැබේ.

2. නගර සභා සඳහා තේරීපත් වන නගර සභා සභාපතිවරුන්ට, උපසභාපතිවරුන්ට සහ සභිකයින්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් ගෙවිය හැකිය.

| | | රු. ශත |
|---|---|---|
| * | නගර සභා සභාපති | 25,000.00 |
| * | උපසභාපති | 20,000.00 |
| * | සභික | 15,000.00 |

(සංග්‍රහ දීමනා ද මෙහි ඇතුළත් බව අවධානයට ගත යුතු ය.)

3. පහත සඳහන් අවස්ථාවන්හිදී, නගර සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් පෑමට නොහැකිය :-

i. දීමනාවට අදාළ මාසයේ පවත්වනු ලැබූ මාසික සභා රැස්වීම් නැතහොත් කාරක සභා රැස්වීම් කිසිවකට සහභාගී නොවීම ;

නැතහොත්

ii. කිසියම් සාපරාධී ක්‍රියාවක් සම්බන්ධ චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම ;

නැතහොත්

iii. නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 184 (1ආ) (අ) වගන්තියට අනුකූලව නගර සභාවේ නැතහොත් නගර සභා සභාපතිවරයාගේ නැතහොත් උපසභාපතිවරයාගේ නැතහොත් සභිකයාගේ ක්‍රියාදාමයන් හා කර්තව්‍යයන් අත්හිටුවීම.

3.1.

i. රැඳවුම්භාරයේ සිටීම නැතහොත් සිරගත වී සිටීම නැතහොත් නිවාඩුවේ සිටීම නැතහොත් සේවයෙන් අත්හිටුවීම කාලසීමාව, යම්කිසි මාසයක කොටසක්ව තිබෙන විටක, එකී මාසයේ පවත්වනු ලැබූ රැස්වීමකට සහභාගී වීම මත එකී කාලයට අදාළ ප්‍රතිශතය පදනමින් මෙම දීමනාව ගෙවිය හැකිය.

ii. වෛද්‍ය හේතූන් මත අදාළ සාධක ඉදිරිපත් කර සභාවේ අනුමැතිය සමගින් සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

iii. නගර සභා සභාපතිවරයෙකු, උපසභාපතිවරයෙකු නැතහොත් සභිකයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

02 - 494/2

---

## උතුරු පළාතේ පළාත් සභාව

### දැන්වීම

උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් සහ සැලසුම්, නීතිය හා විනය, ඉඩම්, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 වන වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උපසභාපති හා සභා සභිකයින් සඳහා වන දීමනා සම්බන්ධව පහත දක්වා ඇති පරිදි වූ විධිවිධාන මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014 නොවැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

සී. වී. විග්නේෂ්වරන්,
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැලසුම්, නීතිය හා විනය,
ඉඩම්, විදුලිය නිවාස, ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත,
රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර,
පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා,
උතුරු පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
අංක 26, සෝමසුන්දරම් ඇවනියු,
චුන්ඩුක්කුලි,
යාපනය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### විධිවිධාන

1. මෙම විධිවිධාන ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට, උපසභාපතිවරුන්ට සහ සභිකයින්ට මාසික දීමනා ගෙවීම සම්බන්ධ විධිවිධාන ලෙස හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභා සඳහා තේරීපත් වන ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට, උපසභාපතිවරුන්ට සහ සභිකයින්ට පහත සඳහන් පරිදි වූ මාසික දීමනාවක් ගෙවිය හැකිය.

| | | රු. ශත |
|---|---|---|
| * | සභාපති | 25,000.00 |
| * | උපසභාපති | 20,000.00 |
| * | සභික | 15,000.00 |

(සංග්‍රහ දීමනා ද මෙහි ඇතුළත් බව අවධානයට ගත යුතු ය.)

3. පහත සඳහන් අවස්ථාවන්හීදී, ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් පෑමට නොහැකිය :-

i. දීමනාවට අදාළ මාසයේ පවත්වනු ලැබූ මාසික සභා රැස්වීම් නැතහොත් කාරක සභා රැස්වීම් කිසිවකට සහභාගී නොවීම ;

නැතහොත්

ii. කිසියම් සාපරාධී ක්‍රියාවක් සම්බන්ධ චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම ;

නැතහොත්

iii. 1987 වන වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(3)(අ) වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ නැතහොත් ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ නැතහොත් උපසභාපතිවරයාගේ නැතහොත් සභිකයාගේ ක්‍රියාදාමයන් හා කර්තව්‍යයන් අත්හිටුවීම.

3.1. කෙසේ වුවද,

i. රැඳවුම්භාරයේ සිටීම නැතහොත් සිරගත වී සිටීම නැතහොත් නිවාඩුවේ සිටීම නැතහොත් සේවයෙන් අත්හිටුවීම කාලසීමාව, යම්කිසි මාසයක කොටසක්ව තිබෙන විටක, එකී මාසයේ පවත්වනු ලැබූ රැස්වීමකට සහභාගී වීම මත එකී කාලයට අදාළ ප්‍රතිශතය පදනමින් මෙම දීමනාව ගෙවිය හැකිය.

ii. වෛද්‍ය හේතූන් මත අදාළ සාධක ඉදිරිපත් කර සභාවේ අනුමැතිය සමගින් සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

iii. ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු නැතහොත් සභිකයෙකු රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවියේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

02 - 494/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.